# ඔබගේ අවසන් වසර ස්වාධීන නිබන්ධය අවසන් කිරීමේදී අනුගමනය කළ යුතු පොදු ආකෘතිය

**සැකසුම හා සංස්කරණය : ආචාර්ය එම්. ශාන්ත විජේසිංහ,**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යනාංශය , ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.**
**පරිවර්තනය හා පරිගණකකරණය භූගෝල විද්‍යා අධ්‍යනාංශයේ සහය කථිකාචාර්ය නදීෂා අබේරත්න මිය**

**සියලුම අවසාන හා තෙවන වසර සිසුන්,**

ඔබගේ අවසාන වසරේ නිබන්ධනය අවසන් කිරීමේදී ඔබට අනුගමනය කළ හැකි පොදු ආකෘතියක් පහත දැක්වේ.

**මෙය පොදු ආකෘතියක් බව සලකන්න. නමුත් ඔබේ අධ්‍යනාංශය විසින් අවධාරණය කර ඇති සමහර ව්‍යතිරේක තිබිය හැකිය.**

**මාතෘකාව පිටුව -** මාතෘකාව, ඔබේ විභාග අංකය සහ ලියාපදිංචි අංකය සමඟ පළමු පිටුවේ පැහැදිලිව ලිවිය යුතුය. මාතෘකාව ඉහළින් කේන්ද්‍රගත විය යුතුය (සාමාන්‍යයෙන් එෆ්.එම්. අභය, අකුරු ප්‍රමාණය 16). ඔබේ විභාග අංකය සහ ලියාපදිංචි අංකය දකුණු පැත්තේ මාතෘකා පිටුවෙහි පහළින් ලිවිය යුතුය. ඉහළන් කේන්ද්‍රගත මාතෘකාවට පහළින්, පහත වාක්‍ය ඛණ්ඩය ලිවිය යුතුය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ........................ අධ්‍යනාංශය (අධ්‍යනාංශයේ නම, උදාහරණය: ආර්ථික විද්‍යා) විසින් පිරිනැමීමට නියමිත...........................(උපාධියේ නම, උදාහරණය: ආර්ථික විද්‍යා) ගෞරව උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන නිබන්ධයයි. (සාමාන්‍යයෙන් එෆ්එම් අභය, අකුරු ප්‍රමාණය 14)

**ප්‍රකාශය**: ඊළඟ පිටුවේදී, ශිෂ්‍යයාගේ සහ සුපරීක්ෂකවරයාගේ ප්‍රකාශය දැක්විය යුතුය.

**පටුන**: මෙහිදී අංකනය කරන ලද ප්‍රධාන පරිච්චේද, උප පරිච්චේද මෙන්ම ඒවායේ මාතෘකා අදාල පිටු අංක සහිතව ඉදිරිපත් කළ යුතුයි.

**වගු ලැයිස්තුව**: මෙම ලැයිස්තුව වගු අංකය, වගුවේ මාතෘකාව සහ වගුව සපයා ඇති පිටු අංකය සමඟ දැක්විය යුතුය. පරිච්ඡේද අංක වලට අනුව සියලුම වගු අංකනය කළ යුතු බව සලකන්න. උදාහරණයක් ලෙස, 1 වන පරිච්ඡේදයේ වගු දෙකක් තිබේ නම්, ඒවා 1.1 සහ 1.2 ලෙස අංකනය කළ යුතුය. 2 වන පරිච්ඡේදයේ වගු 3 ක් තිබේ නම්, ඒවා 2.1, 2.2 සහ 2.3 ලෙස අංකනය කළ යුතුය.

**රූප සටහන් ලැයිස්තුව:** මෙම ලැයිස්තුව රූප සටහන, රූප සටහනේ මාතෘකාව සහ රූප සටහන සපයා ඇති පිටු අංකය සමඟ දැක්විය යුතුය. පරිච්ඡේද අංක වලට අනුව සියලුම රූප සටහන් අංකනය කළ යුතු බව සලකන්න. උදාහරණයක් ලෙස, 1 වන පරිච්ඡේදයේ රූප සටහන් දෙකක් තිබේ නම්, ඒවා 1.1 සහ 1.2 ලෙස අංකනය කළ යුතුය. 2 වන පරිච්ඡේදයේ රූප සටහන් 2 ක් තිබේ නම්, ඒවා 2.1 සහ 2.2 ලෙස අංකනය කළ යුතුය.

**ස්තුතිය**: පර්යේෂණය සාර්ථක කර ගැනීම සඳහා සෑම අතින්ම දායක වූවන්ට ස්තූති කිරීම මෙම පිටුව තුල සිදු කල හැක.

**සාරාංශය**: ඊලග පිටුව තුල සාරාංශය ලියා දැක්විය යුතුය. පර්යේෂණ ගැටලුව, අරමුණු, අනුගමනය කල ක්‍රමවේදය, නිගමන සහ අකාරාදී පිළිවෙලට අනුව සකස් කරන ලද මුඛ්‍ය පද 3 – 5 ත් අතර ප්‍රමාණයකින් යුතුව සාරාංශය එක් පිටුවකින් ලියා දැක්විය යුතුය.

**මේ දක්වා එනම් පටුනේ සිට සාරාංශය දක්වා පිටු රෝමානු අංක i, ii, iii, iv, v,… ..යන අංකවලින් අංකනය කළ යුතු බව සලකන්න.**

පහත දැක්වෙන්නේ පරිච්ඡේද ව්‍යුහය සහ එක් එක් පරිච්ඡේදයේ මෙන්ම උප පරිච්ඡේදවල ඔබ අවධාරනය කළ යුතු ප්‍රධාන කරුණු ය.

**1 වන පරිච්ඡේදය - හැඳින්වීම**

පළමු පරිච්ඡේදය පහත සඳහන් උප පරිච්ඡේද වලින් සමන්විත වේ.

**1.1 මාතෘකාවට හැඳින්වීම**

මෙම උප පරිච්ඡේදය තුළ පර්යේෂණ මාතෘකාව හඳුන්වා දිය යුත්තේ පුළුල් දෘෂ්ටිකෝණයකින් පටන් ගෙන ඔබ අධ්‍යයනය කරන විශේෂිත පර්යේෂණ ගැටලුව දක්වා නිසි ලෙස ගලා යන පරිදි ලිවීමෙනි. ප්‍රථමයෙන්, මාතෘකාවට අදාල මුඛ්‍ය පද (Keywords) නිසි ලෙස හඳුන්වා දිය යුතු අතර ඒවා අවශ්‍ය අවස්ථාවලදී සාහිත්‍ය තුලින් උපුටා දැක්විය යුතුය (In-text citations). එමෙන්ම නිසි ගලායාමක් සහිතව මුඛ්‍ය පද හඳුන්වා දිය යුතුවේ. දැනුමේ හිඩැස ඉස්මතු කර, මේ ආකාරයේ පර්යේෂණ ගැටලුවක් අධ්‍යයනය කිරීමේ වැදගත්කම මෙම කොටස තුළ අවධාරණය කළ යුතුය. මෙම අනු පරිච්ඡේදය සාහිත්‍යයෙන් ලබාගත් සාමාන්‍ය දැනුම මත පදනම්ව පොදුවේ ලිවිය යුතු බවත්, ගැටලුවට අදාළ කිසියම්ම වූ නිශ්චිත කරුණක් මෙහි නොලිවිය යුතු බවත් අවධාරණය කෙරේ.

**1.2 ගැටලු ප්‍රකාශය**

මෙය ඔබ අධ්‍යයනය කරන පර්යේෂණ ගැටලුවට අදාළව සුවිශේෂීව ලිවිය යුතුය. ප්‍රථමයෙන් ඔබ අධ්‍යනය කරන ගැටලුව ප්‍රකාශ කල යුතුය. මෙහිදී ගැටලුව ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර එය ප්‍රමාණවත් දත්ත හා තොරතුරු සාක්ෂි වශයෙන් ගෙන සනාථ කළ යුතුය. අවශ්‍යනම්, ගැටලුවට අදාළ උපකල්පිත හේතුද මෙහිදී ගෙනහැර දැක්විය හැකිය. පර්යේෂණ ගැටළුව ප්‍රකාශයට පත් කිරීම සහ එය සනාථ කිරීමෙන් පසුව, මෙම කොටස තුළ පර්යේෂණ ප්‍රශ්න ද අවසාන වශයෙන් ආමන්ත්‍රණය කල යුතුය.

**1.3 අධ්‍යයනයේ අරමුණු**

පර්යේෂණයේ පොදු සහ සුවිශේෂී අරමුණු මෙම උප පරිච්ඡේදය තුළ ලිවිය යුතුය. ඉහත ආමන්ත්‍රණය කරන ලද පර්යේෂණ ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය හැකි වන පරිදි සෙසු හෙවත් සුවිශේෂී අරමුණු සැලසුම් කළ යුතුය. මෙහිදී සෙසු අරමුණු සියල්ල සුවිශේෂී මෙන්ම, මිනිය හැකි (අවශ්‍යානම්), ළඟාකරගත හැකි, යථාර්තවාදී සහ නියමිත කාලය තුල ලඟා කරගත හැකි ඒවා විය යුතුය. ((SMART සංකල්පයට අනුව).

**1.4 අධ්‍යයනයේ වැදගත්කම**

විශේෂයෙන් මෙම කොටස තුළ, සුවිශේෂී අරමුණු සාක්ෂාත් කර ගැනීම නිසා ඔබේ පර්යේෂණය ජනනය කරනු ලබන වැදගත්කම ලිවිය යුතුය. ඔබගේ පර්යේෂණයේ ප්‍රායෝගික වැදගත්කම ලෙස හඳුන්වන්නේද මෙයයි. එයින් අදහස් වන්නේ ඔබේ පර්යේෂණය සිය නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම තුලින් ජනනය කරන ප්‍රායෝගික වැදගත්කම පැහැදිලිව මෙහිදී අවධාරණය කිරීමයි.

**1.5 පර්යේෂණයේ ගැටළු සහ සීමාවන්**

මෙම පර්යේෂණය සිදු කිරීමේදී ඔබ මුහුණ දුන් ගැටළු මොනවාද යන්න සහ ඔබේ පර්යේෂණයට අදාළ සීමාවන් මෙහි ලිවිය යුතුය. සාමාන්‍යයෙන්, මෙම කොටස අන්තිමට ලියනු ලබන්නේ ඔබට ඔබේ පර්යේෂණය සම්පූර්ණ කරන තෙක් ගැටළු සහ සීමාවන් හරියටම හඳුනාගත නොහැකි වන බැවිනි.

<u>**2 වන පරිච්ඡේදය – සාහිත්‍ය විමර්ශනය**</u>

මෙම පරිච්ඡේදය තුළ සවිස්තරාත්මක සාහිත්‍ය විමර්ශනයක් ලබා දිය යුතුය. ඔබේ පර්යේෂණයේ සුවිශේෂී අරමුණු අනුව සාහිත්‍යය සංවිධානය කළ යුතු අතර එමඟින් සියලු සුවිශේෂී අරමුණු ආවරණය කළ යුතුවේ. මෙම පරිච්චේදයෙහි සියලුම උප මාතෘකා සුවිශේෂී අරමුණු මත පදනම් විය යුතු අතර ඒවා 2.1 (2.11, 2.12, 2.13 ……), 2.2, 2.3 යනාදී ලෙස අංකනය කළ හැකිය.

'විමර්ශනය' යන පදයේ නියම අර්ථයට අනුව මෙහිදී නිසි පරිදි කතුවරුන්ගේ අදහස් විවේචනාත්මකව විමර්ශනය කල යුතු බව සලකන්න. සාහිත්‍ය විමර්ශනයක ප්‍රධාන අරමුණු තුන ඉටුවන පරිදි මෙම පරිච්ඡේදය සංවිධානය කළහැකි නම් මැනවි. එනම්, 2.1 සාහිත්‍ය විමර්ශනය, 2.2 අදාළත්වය සහ 2.3 ඔබේ අධ්‍යයනයේ දායකත්වය/නවතාවය යන උප මාතෘකා තුන ආවරණය වන පරිදි පුළුල් සාහිත්‍ය විමර්ශනයක් කළ හැකි නම් වඩා හොඳය.

**3 වන පරිච්ඡේදය - ක්‍රමවේදය**

මෙම පරිච්ඡේදය තුලින් ඔබ පර්යේෂණයේ සුවිශේෂී අරමුණු ඉටුකරගනු ලබන අකාරය හෙවත් සුවිශේෂී අරමුණු ඉටුකරගැනීම සඳහා ඔබ අනුගමනය කරනු ලබන ක්‍රමවේදය ලියා දැක්විය යුතුවේ. මෙය පර්යේෂණය නිර්මාණය හෙවත් සැලසුම්කිරීම හා පර්යේෂණ ක්‍රම යන අංශ දෙකෙන් සමන්විත වේ. පර්යේෂණය නිර්මාණය හෙවත් සැලසුම් කිරීමේ කොටස යටතේ, පර්යේෂණ දර්ශනය, සංකල්පනාත්මක රාමුව, සංකල්පමය රාමුව මෙහෙයුම්කරණය සහ කල්පිත ගොඩනැගීම යන කොටස් ඇතුළුව ඔබේ පර්යේෂණයේ දාර්ශනික පදනම ආමන්ත්‍රණය කළ යුතුය.

පර්යේෂණ ක්‍රම යටතේ, සංගහනය, නියැදිය  හා නියැදීම, දත්ත රැස් කිරීමේ ක්‍රම, විශ්ලේෂණය සහ ඉදිරිපත් කිරීමේ ක්‍රම ලිවිය යුතුය. මෙම පරිච්ඡේදය තුළ ලියා ඇති සෑම කරුණක්ම ඔබ එසේ සිදු කළේ ඇයිද යන්න අවධාරණය කරමින් පැහැදිලිව සනාථ කළ යුතුය. ක්‍රමවේදය ඔබේ පර්යේෂණයේ සුවිශේෂී අරමුණු වලට අනුකූල වියයුතු යුතු අතර ඔබ ගොඩනැගූ ක්‍රමවේදය මඟින් ඒවා සාක්ෂාත් කරගත හැකි විය යුතුය. ඒ අනුව, මෙම පරිච්ඡේදයේ උප පරිච්ඡේද, 3.1 දාර්ශනික පදනම සහ අධ්‍යයනයේ සංකල්පනාත්මක රාමුව, 3.2 මෙහෙයුම්කරණය, 3.3 කල්පිත ගොඩනැගීම , 3.4 අධ්‍යයන ප්‍රදේශය, සංගහනය, නියැදිය  හා නියැදීම , 3.5 දත්ත එක්රැස් කිරීමේ ක්‍රම,  3.6 දත්ත විශ්ලේෂණ සහ ඉදිරිපත් කිරීමේ ක්‍රම ලෙස ගොඩනගා ගත හැකිය.

**4 වන පරිච්ඡේදය - විශ්ලේෂණය**

විශ්ලේෂණය කල යුත්තේ ඔබගේ පර්යේෂණයේ සුවිශේෂී අරමුණු වන බැවින් මෙම පරිච්ඡේදය සහ  එහි අනු මාතෘකා පර්යේෂණයේ සුවිශේෂී අරමුණු මත පදනම් විය යුතුය. එක් එක් අරමුණ පිළිබඳ ඔබගේ විශ්ලේෂණය තුන්වන පරිච්ඡේදයේ අවධාරණය කර ඇති විශ්ලේෂණ ක්‍රම සමඟ ගැලපිය යුතුය. විවිධ විශ්ලේෂණ ක්‍රම අනුගමනය කරමින් කල්පිත හෙවත් උපන්‍යාස පරීක්‍ෂා කළ ආකාරය සහ ඒවායේ විශ්ලේෂණ ප්‍රථිපල මෙහිදී සාකච්ඡා කළ යුතුය. ප්‍රමාණාත්මක සහ/හෝ ගුණාත්මක ක්‍රම අනුගමනය කරමින් ඔබගේ පර්යේෂණයේ සුවිශේෂී අරමුණු විශ්ලේෂණය කරන ආකාරය මෙහිදී ලිවිය යුතුය.

**5 වන පරිච්ඡේදය - නිගමන සහ යෝජනා**

නිගමනය කොටසේදී, ඔබගේ පර්යේෂණයේ සුවිශේෂී අරමුණු ලගාකරගත් ආකාරය නිගමනය කළ යුතුය. සිව්වන පරිච්චේදයේ සඳහන් කල්පිත/උපන්‍යාස පරීක්ෂණයනට අදාළ නිගමනද මෙහි ලිවිය යුතුය. මෙම පරිච්ඡේදය 5.1 නිගමන, සහ 5.2 යෝජනා ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. නිගමන වලට අනුකූලව පැහැදිලිව යෝජනා  ලිවිය යුතුය. යෝජනා  ඉදිරිපත් කිරීමේදී, පර්යේෂණයට

ලක්වූවන්ගේ අදහස් හා යෝජනා, පවත්නා සාහිත්‍ය දැනුම මෙන්ම පර්යේෂකයා ලෙස ඔබේ දැනුම හා පළපුරුද්ද සැලකිල්ලට ගත යුතුය. අවසාන වශයෙන්, තවදුරටත් සිය පර්යේෂණ මාතෘකාව සම්බන්ධයෙන් පවත්නා දැනුමේ හිඩැස මෙන්ම ඔබේ අධ්‍යයනයේ පවත්නා සීමාවන් අවධාරණය කරමින් වෙනත් පර්යේෂකයන් සඳහා මාර්ග විවෘත කිරීමක් සිදු කළ යුතුය.

**විමර්ශන ග්‍රන්ථ**

- පර්යේෂණ කෘතිය තුල උපුටා දැක්වීම් ලෙස (In-text citations) දක්වා ඇති සියලුම විමර්ශන ග්‍රන්ථ අකාරාදී පිළිවෙලට අනුව හාවඩ් ක්‍රමය (Harvard Method) අනුගමනය කරමින් මෙහි ලැයිස්තු ගත කළ යුතුය.
- ඔබ පර්යේෂණ කෘතිය තුල සිදුකර ඇති සියලු උපුටා දැක්වීම් විමර්ශන ග්‍රන්ථ ලැයිස්තුවට ගෙන ඇත්දැයි පැහැදිලිව පරීක්ෂා කරන්න. එසේ නොමැතිනම් ඔබ විමර්ශන ග්‍රන්ථ දැක්වීමේ Rigorous මූලධර්මය උල්ලංඝනය කරයි.
- කිසි විටකත් විමර්ශන ග්‍රන්ථ අංකනය නොකළ යුතුය.
- විමර්ශන ග්‍රන්ථ ලිවීමේදී තරු ලකුණු, අත් සලකුණු, ඊතල, බුලට්ස් හෝ වෙනත් කිසිදු ලකුණක් භාවිතා නොකළ යුතුය.
- විමර්ශන ග්‍රන්ථ කිසිසේත් වර්ගීකරණය නොකළ යුතුය.
- වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති හාවඩ් විමර්ශන ග්‍රන්ථ මාර්ගෝපදේශය (Harvard Referencing Guide) අනුගමනය කිරීමෙන් මෙය සකස් කළ යුතුය.

**විමර්ශන ග්‍රන්ථ ඇතුළුව සියලුම පරිච්ඡේද 1, 2, 3, 4, 5, 6, .............. යන අරාබි අංකවලින් අංකනය කළ යුතු බව සලකන්න.**

**උපග්‍රන්ථය**

ඔබේ පර්යේෂණයට අදාළ ප්‍රශ්නාවලිය ඇතුළු අනෙකුත් අතිරේක ලියවිලි උපග්‍රන්ථය I, උපග්‍රන්ථය II, උපග්‍රන්ථය III ලෙස නම් කිරීමෙන් දැක්විය යුතුය. උදාහරණයක් වශයෙන්;

උපග්‍රන්ථය I - ප්‍රශ්නාවලිය

උපග්‍රන්ථය II - සම්මුඛ සාකච්චා සඳහා භාවිතා කල ආකෘතිය

සියලුම උපග්‍රන්ථ I, II, III, IV, V.......... ලෙස කැපිටල් රෝම ඉලක්කම් වලින් අංකනය කළ යුතු බව සලකන්න

**මගේ සුභ පැතුම්!**

**ලබා දී ඇති මාර්ගෝපදේශයන් අනුගමනය කලාට ඔබට ස්තූතියි.**